සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

2025-01
55069

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | කාලය / காலம் / Time: පැය 2 |

නම / பெயர் / Name ..........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි:

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටසේ 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලටම වඩාත් නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. 16 වන සියවසේ දී පෘතුගීසින් ආසියාවෙන් ගෙනගිය කුළුබඩු ලන්දේසීන් විසින් මිල දී ගත් වරාය කුමක් ද?
(1) බොම්බාය (2) මදුරාසිය (3) ලිස්බන් (4) කැලිකට්

02. මෙරටට පැමිණි යුරෝපා ජාතීන් අතරින් උඩරට රාජ්‍ය සමග වැඩි කාලයක් යහපත් සබඳතා පවත්වාගත් ජාතිය වන්නේ?
(1) පෘතුගීසින් ය. (2) ලන්දේසීන් ය. (3) ඉංග්‍රීසීන් ය. (4) ප්‍රංශවරු ය.

03. ක්‍රි.ව. 1766 දී ලන්දේසීන් සමග ගිවිසුමකට එළඹි උඩරට පාලකයා කවුරුන් ද?
(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (2) ශ්‍රී විජය රාජසිංහ රජු (3) දෙවන රාජසිංහ රජු (4) රාජාධිරාජසිංහ රජු

04. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රි.ව. 1798 සිට 1802 අතර කාලයේ ගෙනගිය පාලනය හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) කිරීටයේ පාලනය (2) මදුරාසි පාලනය
(3) වෙළඳ සමාගමේ පාලනය (4) ද්විත්ව පාලනය

05. ක්‍රි.ව. 1803 ඉංග්‍රීසින්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථකවීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ මින් කුමක් ද?
(1) මුත්තුසාමි රජු ලෙස උඩරැටියන් පිළි නො ගැනීම.
(2) රජු හා ජනතාව අතර පැවති යහපත් සබඳතාවය.
(3) ඉංග්‍රීසි හමුදාවන්ට උඩරැටියන්ගේ සහය නො ලැබීම.
(4) මහනුවර නගරය අල්ලා ගැනීමට ඉංග්‍රීසින්ට නොහැකි වීම.

06. උඩරට රාජ්‍යයේ අභ්‍යන්තර බල අරගලයේ උච්චතම අවස්ථාව ලෙස සැළකෙන්නේ,
(1) රජු හා රදළ ප්‍රධානීන් අතර ඇති වූ අර්බුදය යි.
(2) රජු හා භික්ෂූන් වහන්සේලා අතර ඇතිවූ අර්බුදය යි.
(3) රදළ ප්‍රධානීන් අතර ඇති වී අර්බුදය යි.
(4) රජු හා සාමාන්‍ය වැසියන් අතර ඇති වූ අර්බුදය යි.

07. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට රජයේ වියදම අඩුකර ගැනීම පිණිස ඉදිරිපත් කළ කෝල්බෲක් යෝජනාවක් පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) උඩරට පහතරට ඒකාබද්ධ කොට පාලනය කිරීම. (2) රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
(3) රාජකාරී ශ්‍රම ක්‍රමය අවලංගු කිරීම. (4) රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.

08. වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීමට පුරෝගාමී වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවුරුන් ද?
(1) ආතර් ගෝඩ්න් (2) විලියම් ග්‍රෙගරි (3) වෙස්ට් රිජ්වේ (4) හෙන්රි වෝඩ්

09. • මාළිගාකන්ද විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම.
• තරුණ බෞද්ධ සංගමය පිහිටුවීම.
ඉහත සේවාවන් සිදු කිරීමට පුරෝගාමී වූ නායකයින් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වලානේ සිද්ධාර්ථ හිමි, ඩී. බී. ජයතිලක මහතා
(2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, ඩී. බී. ජයතිලක මහතා
(3) රත්මලානේ ධර්මාලෝක හිමි, පියදාස සිරිසේන මහතා
(4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, ජෝන් ද සිල්වා මහතා

10. මිෂනාරී සංවිධාන තම ආගම් ප්‍රචාරණය සඳහා මුද්‍රණය කරන ලද ප්‍රකාශයක් නොවන්නේ මින් කුමක් ද?
(1) මාසික තැග්ග (2) උරගල (3) ලක්මිණි පහන (4) ලංකා නිධානය

11. ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීමට පුරෝගාමී මෙහෙවරක් ඉටුකළ සිවිල් නිලධාරියා කවුරුන් ද?
(1) මංගල් පාණ්ඩේ (2) ඇලන් ඔක්ටේවියන් හියුම්
(3) බහදූර් ෂා (4) රාම් මෝහන් රෝයි

12. ඉන්දියාවට පැමිණි යුරෝපා ජාතීන් තම බලය ව්‍යාප්ත කළ ප්‍රදේශ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. පෘතුගීසි | A අහමදාබාද් |
| 2. ලන්දේසි | B ගෝව |
| 3. ඉංග්‍රීසි | C පොන්ඩිචේරි |
| 4. ප්‍රංශ | D ගුජරාට් |

(1) BDAC (2) ADBC (3) BADC (4) DCAB

13. උගත් ලාංකිකයන් අතරින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව පෙන්වා දෙමින් මුල් වරට විධිමත් සංදේශයක් යටත් විජිත භාර ලේකම්වරයාට ඉදිරිපත් කළේ කවුරුන් ද?
(1) විලියම් ඩිග්බි (2) ජෝර්ජ් වෝල් (3) ජේම්ස් පීරිස් (4) හෙන්රි මැකලම්

14. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති තනතුරට පත් වූයේ කවුරුන් ද?
(1) විලියම් ගොපල්ලව (2) පොන්නම්බලම් අරුණාචලම්
(3) ඒ. ඊ. මොලමුරේ (4) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර

15. සෝල්බරි ප්‍රතිසංස්කරණයට අනුව ව්‍යවස්ථාදායකය හෙවත් නීති සම්පාදනය කළ ආයතනය කුමන නමකින් හැඳින්වේ ද?
(1) ජාතික රාජ්‍ය සභාව (2) රාජ්‍ය මන්ත්‍රණ සභාව
(3) ව්‍යවස්ථාදායක සභාව (4) ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව

16. ක්‍රි:ව: 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව සම්පාදනය කොට ක්‍රියාත්මක කළ අගමැතිවරයා කවුරුන් ද?
(1) සිරිමාවෝ බණ්ඩාරනායක (2) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක
(3) ජේ. ආර්. ජයවර්ධන (4) විජයානන්ද දහනායක

17. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා ද විධායකයේ නායකයා ද සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ද වන්නේ කවුරුන් ද?
(1) අගමැතිවරයා (2) ජනාධිපතිවරයා (3) අග්‍රවිනිශ්චයකාරවරයා (4) කතානායකවරයා

18. ක්‍රි:ව: 1931 1947 කාලයේ මෙරට කෘෂිකර්ම ඇමතිවරයා ලෙස ඩී. එස්. සේනානායක මැතිතුමා සිදුකළ ප්‍රධාන සේවාවක් වූයේ මින් කුමක් ද?
(1) වතුවගාව දියුණු කිරීම. (2) මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීම.
(3) වී පර්යේෂණ ආයතනය පිහිටුවීම. (4) ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කිරීම.

19. මෙරට ප්‍රථම කාර්මික ජනපදය පිහිටුවූයේ කුමන ස්ථානයක ද?
(1) රත්මලාන (2) ඒකල (3) දේවහුව (4) පැදවිය

20. දකුණු ආසියාවේ සෙසු රටවල් හා සසඳන විට අධ්‍යාපන කටයුතු අතරින් ශ්‍රී ලංකාව කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගැනීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ මින් කුමක් ද?
(1) විශ්වවිද්‍යාල ආරම්භ කිරීම (2) පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම
(3) නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. (4) ශිෂ්‍ය සුභසාධන කටයුතු දියුණු කිරීම.

(ලකුණු 20 x 2 = 40)

2025-01
G.09
History.

## II කොටස

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

01.



A

i. A - A රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
B - මෙතුමා පිහිටුවාගත් දේශපාලන පක්ෂය කුමක් ද?
C - ක්‍රි: ව: 1956 මැතිවරණයෙන් මෙතුමා පත් වූ තනතුර කුමක් ද?
D - 1956 මැතිවරණයේ දී මෙතුමාට සහාය දුන් පංචමහා බලවේග වලින් දෙකක් නම් කරන්න..



B

ii. A - B රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?
B - මෙය කුමන අධිරාජ්‍යයකට අයත් ද?
C - මෙය නිර්මාණය කළ පාලකයා කවුරුන් ද?
D - මෙම නිර්මාණය පිහිටා ඇති රට නම් කරන්න.

(ලකුණු 2 x 8 = 16)

02. i. මෙරට පාලනය කළ ලන්දේසීන් හා සම්බන්ධ පහත පුද්ගලයින් කවුරුන් දැයි A, B අනුපිළිවෙළින් ලියන්න.
A - ශ්‍රී ලංකාවේ අවසන් ලන්දේසි ආණ්ඩුකාරවරයා -
B - කිවි ලිපිය ලියූ ඕලන්ද පාලකයා -

(ලකුණු 02)

ii. ක්‍රි:ව: 1797 දී ඉංග්‍රීසින්ට විරුද්ධව ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ලට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. උඩරට රාජ්‍ය අත්පත් කර ගැනීමට ඉංග්‍රීසීන් අනුගමනය කළ උපායශීලී ප්‍රතිපත්තිය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

03. i. පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු A, B අනුපිළිවෙළින් ලියන්න.
A - ක්‍රි.ව. 1815 ගිවිසුම අත්සන් කිරීමට පෙර සිංහල කොඩිය පහත හෙළීමට විරුද්ධ වූ ස්වාමීන් වහන්සේ -
B - ඉංග්‍රීසින් වෙනුවෙන් ගිවිසුමට අත්සන් තැබූ ආණ්ඩුකාරවරයා -

(ලකුණු 02)

ii. පහත තොරතුරු හා සම්බන්ධ පිළිතුරු A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.
A - 1818 නිදහස් සටන ආරම්භ වූ ප්‍රදේශය -
B - 1818 නිදහස් සටන ආරම්භයේ උඩරට රජු ලෙස පෙනී සිටි තැනැත්තා -
C - 1848 නිදහස් සටන ආරම්භ වන විට මෙරට සිටි ආණ්ඩුකාරවරයා -
D - 1848 දෙවන නිදහස් සටනේ "ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි" නමින් ඔටුනු පැළඳි පුද්ගලයා -

(ලකුණු 04)

iii. බ්‍රිතාන්‍යයින් යටතේ මෙරට වගා කරන ලද ආර්ථික බෝග දෙකක් නම් කොට, ඉන් එක් බෝගයක් මෙරට තුළ සාර්ථක වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න.

(ලකුණු 05)

04. i. මෙරට පැමිණි මිෂනාරි සංවිධාන ස්වකීය ආගම පැතිර වීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. පහත තොරතුරු හා සම්බන්ධ පිළිතුරු A, B, C, D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - බෞද්ධයන් වෙනුවෙන් ගාල්ලේ මුද්‍රණාලයක් ආරම්භ කිරීමට පුරෝගාමී වූ ස්වාමීන් වහන්සේ -

B - පානදුරා වාදය පැවැත්වීමට මූලිකත්වය ගත් ස්වාමීන් වහන්සේ -

C - කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කළ පුද්ගලයා -

D - හින්දු දරුවන්ගේ අධ්‍යාපන උන්නතියට පරමේශ්වර විද්‍යාලය පිහිටුවීමට පුරෝගාමී වූ පුද්ගලයා - (ලකුණු 04)

iii. පහත සඳහන් පුද්ගලයින් දෙදෙනෙකු පිළිබඳ කෙටි විස්තර ලියන්න.

A - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

B - ආරුමුග නාවලර්තුමා

C - එම්. සී. සිද්දිලෙබ්බේ මහතා

D - අනගාරික ධර්මපාලතුමා (ලකුණු 05)

05. i. ඉංග්‍රීසින් ඉන්දියාව තුළ බලය පැතිරවීමේ දී අනුගමනය කළ උපායශීලි ප්‍රතිපත්ති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. සිපොයි කැරැල්ල ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. ඉන්දියානු නිදහස් සටනේ කැපී පෙනෙන නායකයින් දෙදෙනෙකු නම් කොට, ඔවුන්ගේ සේවාවන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. කෝල්බෲක් කොමිසමේ විමර්ශනයට ලක් වූ ක්ෂේත්‍ර දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් ප්‍රතිසංස්කරණ යෝජනා කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයකින් හඳුන්වා දුන්නේ දැයි A, B, C, D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත්කිරීම. -

B - රාජ්‍ය සේවා කොමිසම පිහිටු වීම. -

C - පරිපාලන කටයුතු සඳහා මුලු රටම පළාත් පහකට බෙදීම. -

D - ව්‍යවස්ථාදායක සභාවට සාමාජිකයින් 37 දක්වා වැඩි කිරීම. - (ලකුණු 04)

iii. ක්‍රි.ව. 1931 හඳුන්වා දුන් ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 0…)

07. i. පහත තොරතුරුවලට අදාළ නිවැරදි පිළිතුරු A, B අනුපිළිවෙළින් ලියන්න.

A - ක්‍රි.ව. 1953 හර්තාලය පැවති සමයේ මෙරට අගමැතිවරයා -

B - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්නා අවස්ථාවේදී මෙරට සිටි අගමැතිවරයා - (ලකුණු 02)

ii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික මිනිස් අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුව උදෙසා මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය දායක වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)